# සන්දේශ ලක්ෂණ භාවිතය: පාලි සන්දේස කාව්‍ය සඳහා උපයුක්ත වී ඇති ආකාරය (විසිඑක් (21) වන සියවසෙහි සන්දේස කාව්‍ය ග්‍රන්ථ ඇසුරින්)

පැලවත්තේ රතනසිරි හිමි[1]

## හැඳින්වීම

සන්දේස නාමයෙන් පාලි සාහිත්‍යයට වූ කලී මේ මොහොත වන විට එකතු වී ඇති ග්‍රන්ථ සංඛ්‍යාව හයකි (06). ඒ අතරින් ග්‍රන්ථ ද්විත්වයක් විසිඑක් (21) වන සියවසෙහි රචනා වූ ග්‍රන්ථයෝ වෙති. සංස්කෘත සාහිත්‍යය ආභාසය කොට ගෙන රචනා වී ඇති විවිධ සාහිත්‍ය අංගයන්ගේ සාර්ථකත්වය මොනවට පෙන්නුම් කරනුයේ ඒ ඒ සාහිත්‍යාංගයන්ට අයත් ලක්ෂණ පරිපූර්ණ ලෙස භාවිත කරමින් රචනාව සිදුකරන ලද කල්හි ය. ඒ අනුව සංස්කෘත සන්දේශ කාව්‍ය විෂයෙහි ලා ''ප්‍රසිද්ධං නායකී කෘත්‍ය'' ආදී වශයෙන් ප්‍රකාශිත සන්දේශ ලක්ෂණ පාලි සාහිත්‍යයට උපයුක්ත කර ඇති ආකාරය කෙසේ දැයි මෙහි දී විමසීමට භාජනය කෙරුණි. මානාවුලු, වුත්තමාලා සතක, සිරිරාම හා ගරුළ ආදී පුරාණ පාලි සන්දේස සාහිත්‍ය ග්‍රන්ථ කෙරෙහි යම් පිළිගැනීමක් මේ වන විටත් පාලි වියතුන් අතර පවතින බැවින් විසිඑක් (21) වන සියවසෙහි රචනා වූ පාලි සන්දේස කාව්‍ය ග්‍රන්ථයන් කෙරෙහි අවධානය යොමු කිරීමට අදහස් කරන ලදි. විසිඑක් (21) වන සියවසට අයත් අල්බාතර සන්දේසය ආචාර්ය විජිත එස් කුමාර මහතා විසින් 2017 වර්ෂයේ දී රචනා කරන ලද අතර පාලි මයූර සන්දේසය පැලවත්තේ රතනසිරි හිමියන් විසින් 2024 වර්ෂයේ දී රචනා කරන ලදි. එකී ග්‍රන්ථ පමණක් මෙහි භාවිත කරන්නේ පර්යේෂණයෙහි පහසුව සඳහා ය.

සංස්කෘත සන්දේශ ලක්ෂණ අනුව යමින් පාලි සන්දේසකරුවා ස්වකීය නිර්මාණයන් කෙතරම් දුරට සාර්ථකත්වය කරා ගෙනයනු ලැබේ දැයි මෙයින් අධ්‍යයනය කිරීමට අවකාශ සැලසෙනු ඇත. එය විසිඑක්වන සියවසේ පාලි සන්දේසකරුවාගේ සාර්ථකත්වය මෙන් ම එය නූතන පාලි සාහිත්‍යකරුවා මත නව ග්‍රන්ථ රචනය කෙරෙහි අභිප්‍රේරණයක් ඇති කිරීමට සමර්ථ වනු ඇතැයි ද අපේක්ෂා කරනු ලැබේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයෙහි විශ්වසනීයත්වය වඩාත් තහවුරු කර ගැනීම පිණිස වෙනත් පුද්ගල මතයන්හි නො පිහිටා පළමු ව දත්ත රැස් කර ගැනීමේ දී ප්‍රාථමික දත්ත වශයෙන් ඒ ඒ කතුවරු විසින් රචනා කරන ලද සන්දේස කාව්‍ය ආදී ස්වතන්ත්‍ර නිර්මාණ කෘති අධ්‍යයනය කරන ලදි. ද්විතීයික දත්ත වශයෙන් එකී කෘති පිළිබඳ විවිධ අයවලුන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් හා මතවාද සහිත කෘති හා ලිපි ආදිය අධ්‍යයනය කරන ලදි. තව ද මෙහි ගුණාත්මකභාවය වර්ධනය කර ගැනීම පිණිස ගුණාත්මක දත්ත වශයෙන් පාලි සන්දේස කාව්‍ය සාහිත්‍යය පිළිබඳ වූ මත ඉදිරිපත් කර ඇති පොල්වත්තේ බුද්ධදත්ත හිමි විරචිත පාලි සාහිත්‍යය වැනි කෘති අධ්‍යයනය කරන ලදි.

1. 8346262@gmail.com

එසේ රැස් කර ගත් දත්ත ඇසුරින් මේඝදූතය ආදී කොට ඇති සංස්කෘත සන්දේශ කාව්‍යයන් හා එකී ලක්ෂණ ඇතුළත් සිංහල සන්දේශ කෘති ද උද්ගාමී තර්කන ක්‍රමයෙන් වෙන වෙන ම ග්‍රන්ථ වශයෙන් ගෙන ඒවායෙහි සන්දේශ කාව්‍ය ලක්ෂණ හා ඒවායේ භාවිතාව හඳුනාගනු ලැබුණි. ඒ අනුව ක්‍රමානුකූලව නිරීක්ෂණය කොට රැස් කර ගත් දත්ත මත පදනම්ව සන්දේශ කාව්‍යය ලක්ෂණ අනුව යමින් පාලි සන්දේස කෘති අතරින් අල්බාතර සන්දේසය හා මයූර සන්දේසය එකී ලක්ෂණවලට ගැළපීමක් වේදැයි නිරීක්ෂණය කරන ලදි. තව ද එකී ලක්ෂණයන්ට හානි නො කොට පාලි බසින් සන්දේශයක් රචනා කිරීමේ දී භාවිත කර ඇති නව ප්‍රවේශයන් කවරේද යන්න ද නිරීක්ෂණය කරන ලදි. එකී නිරීක්ෂණයන්ට අනුකූලව නිගමනයන්ට එළඹුණි.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

''ප්‍රසිද්ධං නායකී කෘත්‍ය - පුරුෂං වාථ යොෂිථම්'' යනාදී වශයෙන් සංස්කෘත සාහිත්‍යයෙහි කී සෙයින්,

1 ප්‍රසිද්ධ පුරුෂයකු හෝ ස්ත්‍රියක සංදේශ කාව්‍යයේ කථා නායකයා හෝ නායිකාව වීම.

2 සංදේශය ගෙන යන දූතයා කුලය, වංශය හා ගෝත්‍රය ආදී වශයෙන් උසස් අයකු වීම.

3 ඓතිහාසික පුවතක් හෝ ආශීර්වාදයක් පෙරටු කොට අස්න ආරම්භ කිරීම.

4 දූතයාගේ සුවදුක් ආදිය විචාරීමෙන් පසු දූතයා පිළිබඳ වර්ණනාවක් කිරීම.

5 අස්න පිළිබඳ විස්තරය දැනුම් දීම පසුවට තබා යා යුතු තැන දූතයාට පවසා යන ගමන් මාර්ගය පිළිබද වර්ණනා කිරීම.

6 තමා යා යුතු ගමන් මාර්ගයෙහි හමුවන ප්‍රසිද්ධ ස්ථාන පිළිබඳ වර්ණනා හා අතරමග හමුවන නායකයන්ගේ ගුණ වර්ණනා කිරීම.

7 අස්න ලබන තැනැත්තා පිළිබඳ වර්ණනා කිරීම.

8 අස්න පැවසීම හා දූතයාට ආශීර්වාද කිරීම.

යනාදී ලක්ෂණ සන්දේශ කාව්‍යයක අන්තර්ගත විය යුතු ය. මෙහි දී අපගේ අධ්‍යයනයට භාජනය වන සන්දේශ අතරින් අල්බතරා සන්දේසයෙහි අරමුණ වී ඇත්තේ තමාට වූ අසාධාරණයක් කියා පෑම ය. එබැවින් එහි කථා නායකයා බවට කතුවරයා පත් වේ. මයූර සන්දේසය මෙහි කථා නායකයා ලෙස එක් විශේෂ පුද්ගලයෙකු ගැනීම හැර ප්‍රසිද්ධ ස්ථානයක් හා එහි පිරිස ගෙන ඇත. ඒ අනුව මෙහි කථා නායකයා වන්නේ රුහුණ විශ්වවිද්‍යාලය හා එහි පිරිසයි. අල්බාතර සන්දේසයෙහි දූතයා ලෙස උසස් කුල සහිත හා වේගයෙන් අරමුණට යා හැකි අල්බාතර පක්ෂියා තෝරා ගෙන ඇත. මයූර සන්දේසය උසස් කුල සහිත මොණරෙකු දූතයා ලෙස යොදා ගෙන ඇති අතර එයට හේතු ලෙස සරසවි භූමියෙහි මොණරුන් බහුලව ගැවසීමත් කඳ කුමරුගේ වාහනය ලෙස සැලකීමත් බව කතුවරයා දක්වා ඇත. අල්බාතර සන්දේසය රුහුණ සරසවියෙන්

තමාට වූ අසාධාරණය ප්‍රකාශ කිරීම අරමුණ කර ගෙන ඇති අතර මයූර සන්දේසයෙහි අරමුණ වී ඇත්තේ රුහුණ සරසවියට ආශීර්වාද කිරීමයි. එසේ ම කෘති ද්විත්වයෙහි ග්‍රන්ථාරම්භයේ දී සහ ග්‍රන්ථාවසානයේ දූත වර්ණනා මොනවට දැකිය හැකි ය. මයූර සන්දේසයෙහි දූතයාගේ ගමන් මාර්ගය වශයෙන් මාතර රුහුණ විශ්වවිද්‍යාලයේ සිට කතරගම දේවාල සහ කිරි වෙහෙර පුදබිම දක්වා වෙයි. මඟ වර්ණනා කරමින් ඒ අතර මැද ඇති ප්‍රසිද්ධ ස්ථාන හා ඒවාට සම්බන්ධ ප්‍රසිද්ධ පුද්ගලයන් වර්ණිත ය. අස්න ලබනුයේ කතරගම දෙවියන් විසිනි. කඳකුමරු වර්ණනා සහිතව අස්න ප්‍රකාශ කිරීමක් මෙම අස්න තුළ දැකගත හැකි ය. මෙකී සියලු වර්ණනා සහිතව පද්‍ය සියයකින් (100) යුක්තව මෙම ග්‍රන්ථය රචනා කර ඇත. අල්බාතර සන්දේසය ගාථා හතළිස් හයකින් (46) යුක්තව රචනා කර ඇත. ග්‍රන්ථ දෙක සාපේක්ෂව බැලීමේ දී අල්බාතර සන්දේසයට වඩා සන්දේශ ලක්ෂණ භාවිතාවක් මයූර සන්දේසය තුළ දැකගත හැකි ය.

ඒ අනුව සාකච්ඡා කිරීමේ දී සංස්කෘත සාහිත්‍යය අනුව යමින් සංවර්ධනය වන සිංහල සාහිත්‍යය මෙන් ම පාලි සාහිත්‍යය ද සන්දේස කාව්‍ය විෂයෙහි ලා සංස්කෘත සන්දේශ ලක්ෂණ අනුව යමින් ස්වකීය රචනාවන් සිදු කර ඇති බව දැකගත හැකි ය.

**නිගමනය සහ යෝජනා**

මෙම අධ්‍යයනයෙහි දී පාලි අල්බාතර සන්දේස කාව්‍යය හා මයූර සන්දේස කාව්‍යය විෂයෙහි වෙසෙසින් අවධානය යොමු කරමින් අධ්‍යයනය කිරීමෙන් පෙනී යන්නේ විසිඑක් වන සියවසෙහි රචනා වූ පාලි සන්දේස කාව්‍යද්වය කෙරෙහි ම සංස්කෘත සන්දේශ හා සන්දේශ කාව්‍ය ලක්ෂණ සැලකිය යුතු බලපෑමක් ඇති කර ඇති බව ය. ඒ බව පෙනී යන්නේ, කෘති ද්විත්වයෙහි ම විධිමත් ආරම්භය, කථා නායකයා ලෙස අල්බාතර සන්දේසයේ දී කතුවරයා හා මයූර සන්දේසයේ දී සරසවිය හා එහි ප්‍රජාව මොනවට වර්ණනා කිරීම, දූතයාගේ විචාරාත්මක වර්ණනා, සහ ගමන් මාර්ග යෙහි සංකීර්ණ හා අලංකාරමත් විස්තරය ඇතුළු ලක්ෂණයන්හි දී වේ. නමුත් නූතන පාලි සන්දේස කාව්‍ය ග්‍රන්ථයන්හි දී දූතයාගේ චරිතය සහ වාර්තාකරන ආකාරය, භාෂා උපක්‍රම, සහ ගමන් මාර්ගයෙහි විස්තර කිරීම සම්බන්ධයෙන් විශාල වෙනස්කම් සිදු වී ඇති බව මෙම පර්යේෂණය මඟින් තහවුරු කර ගෙන ඇත. පූර්ව සන්දේශකරුවන් මෙන් ම දූතයා ලෙස මෙකී ග්‍රන්ථද්වයේ දී පක්ෂියෙකු යොදා ගෙන ඇතත් අල්බාතර සන්දේසයේ දී අල්බාතර පක්ෂියා යොදා ගැනීම සුවිශේෂී ලක්ෂයක් ලෙස දැකිය හැකි ය. පාලි සන්දේස කාව්‍යයක් ලෙස මයූර සන්දේසය ද පරිණත කාව්‍යයක් වන අතර එය අතීත සංස්කෘත ලක්ෂණයන් ගෙන භාවිත කරන විට, නූතන අවස්ථාවන්ට අදාළ ව නව ප්‍රවේශයක් ගෙන ඇති බවක් දැකගත හැකි ය. කථානායකයා ලෙස සරසවියක් හා එයට සම්බන්ධ පුද්ගලයන් යොදා ගැනීම එකී නව ප්‍රවේශයන් අතරින් එකක් ලෙස සැලකිය හැකි ය.

එමෙන් ම, නව පාලි සන්දේස කාව්‍යයන් නූතන සමාජීය, සංස්කෘතික සහ ආගමික ප්‍රවණතා සහ අවශ්‍යතාවන්ට ගැළපෙන පරිද්දෙන් ගුණාත්මකව වර්තමාන කාලයට ගැළපෙන පරිදි සංවර්ධනය කර ඇත. එම නිසා පාලි සාහිත්‍යයෙහි සන්දේශ කාව්‍යය නව යුගයේ පදනමක් ස්ථාපිත කර ඇත. අල්බතරා සන්දේසයෙහි හා මයූර සන්දේසයෙහි ඇති නිර්මාණාත්මක සාර්ථකත්වය නව පාලි සන්දේස කාව්‍ය රචකයින්ට

මූලික අභිප්‍රේරණයක් බවට පත්වනු ඇති බව මෙම පර්යේෂණයේ දී විස්වාස කරනු ලැබේ.

**මුඛ්‍ය පදඃ** අල්බාතර සන්දේසය, පාලි සාහිත්‍යය, මයුර සන්දේසය, සංස්කෘත බලපෑම, සන්දේශ කාව්‍ය

## ආශ්‍රිත ග්‍රන්ථ

කුමාර, විජිත එස්. (2017). *අල්බාතර සන්දෙසො* (Albatara samdeso : the message of albatras). නුගවෙලඃ ශ්‍රී සෝනුත්තර පිරිවෙන. බාලසූරිය, බී. එම්. පී. (පරි.), (2015). *සංස්කෘත සාහිත්‍යය.* කොළඹඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (1966). *පාලි සාහිත්‍යය.* කොළඹඃ රත්න පොත් ප්‍රකාශකයෝ.

රතනසිරි හිමි, පැලවත්තේ (2024). *මයූර සන්දෙසො.* කොළඹඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

වැගන්තලේ, එච්. බී. ආර්. (2013). *සංස්කෘත සාහිත්‍යය ඉතිහාසය.* කොළඹඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

සුගතවංස හිමි, එච්. (2015). *පාලි සන්දේස සාහිත්‍යය.* කොළඹඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.